# Holiday Assignments

**ADVANCE LEVEL III**

**Subject: Political Science** **Grade 13** **Medium: Sinhala**

## 13 ශ්‍රේණිය

## ප්‍රශ්න පත්‍ර අංක 04

❖ **පහත ප්‍රශ්න සියල්ලටම කෙටි පිළිතුරු සපයන්න.**

01. පුරවැසි දේශපාලන චර්යාව හා ආණ්ඩුකරණ ක්‍රියාවලීන් හැඩගස්වන ප්‍රධාන සාධකයක් වන්නේ දේශපාලන මතවාදයි. එම මතවාදයන් 02ක් දක්වන්න.

i.............................................................

ii.............................................................

02. දේශපාලන විද්‍යා අධ්‍යයන ප්‍රවේශ ද්විත්වයක් නම් කරන්න.

i.............................................................

ii.............................................................

03. නිලබල ක්‍රමය (Bureaucracy) පිළිබඳ සම්භාව්‍ය න්‍යාය ඉදිරිපත් කළ මැක්ස් වේබර් විසින් සමාජ ක්‍රමවල පවතින අධිකාරී ක්‍රම 03ක් පෙන්වා දී ඇත. ඉන් 02ක් සඳහන් කරන්න.

i.............................................................

ii.............................................................

04. ජාතිකවාදය සහ දේශපාලන මතවාදය ස්වරූප 02කින් ඉදිරිපත් වී ඇත. ඒවා නම් කරන්න.

i.............................................................

ii.............................................................

05. ගැටුම් සමථන මාධ්‍යයක් වන සහමන්ත්‍රණය සිදුකරන ආකාර 03ක් පවතී. ඉන් දෙකක් නම් කරන්න.

i……………………………………………………………

ii……………………………………………………………

06. ගැටුමේ සාධනීය කාර්යයන් දෙකක් සඳහන් කරන්න.

i……………………………………………………………

ii……………………………………………………………

07. නූතන ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුක්‍රම තුළ ජනතා නියෝජිතයන් තෝරා පත්කරගැනීම සඳහා භාවිතයට ගැනෙන මැතිවරණ ක්‍රම 02ක් තිබේ. එම දෙක නම් කරන්න.

i……………………………………………………………

ii……………………………………………………………

08. රාජ්‍ය ප්‍රතිපත්ති සම්පාදනය හා ක්‍රියාවට නැංවීම පිළිබඳ ප්‍රතිපත්ති චක්‍රය (Policy Cycle) අවධි හතකින් සමන්විත වේ. එහි මුල් අවධි දෙක සඳහන් කරන්න.

i……………………………………………………………

ii……………………………………………………………

09. පහත දැක්වෙන ගති ලක්ෂණ අදාළවන දේශපාලන මතවාද දෙක පිළිවෙලින් නම් කරන්න.

i රාජ්‍ය වන්දනය (Cult of the state)……………………………………………………….

ii පෞද්ගලික නිදහස (Personal Freedom) ……………………………………………

10. දේශපාලන පක්ෂයක කාර්යයන් දෙකක් දක්වන්න.

i……………………………………………………………

ii……………………………………………………………

11. ලංකාවේ වර්තමානයේ ක්‍රියාකාරීව පවතින ජනවාර්ගික පක්ෂ 02ක් සඳහන් කරන්න.

i……………………………………………………………

ii……………………………………………………………

12. වර්තමාන ලංකාවේ දේශපාලන පක්ෂ ක්‍රමයේ දකින්නට ලැබෙන සුවිශේෂී ලක්ෂණ දෙකක් දක්වන්න.

i.............................................................

ii............................................................

13. ඇමරිකානු ආණ්ඩුක්‍රමය තුළ මධ්‍යම ආණ්ඩුවට හා ප්‍රාන්ත ආණ්ඩුවලට තම තමන්ට අයත් බලතල වෙන් වෙන්ව තිබුණ ද ප්‍රාන්ත රාජ්‍ය සම්බන්ධයෙන් මධ්‍යම රජයට පැවරී ඇති බලය කරුණු 04ක් මත රඳා පවතී. ඉන් දෙකක් සඳහන් කරන්න.

i.............................................................

ii............................................................

14. ඉන්දීය ෆෙඩරල් ක්‍රමයේ දකින්නට ලැබෙන විශේෂ ලක්ෂණ දෙකක් නම් කරන්න.

i.............................................................

ii............................................................

15. ස්විට්සර්ලන්ත ආණ්ඩුව තල තුනකින් සමන්විත වේ. ඉන් දෙකක් නම් කරන්න.

i.............................................................

ii............................................................

16. ප්‍රංශ ව්‍යවස්ථාදායකය ද්විමාණ්ඩලික වේ.

i එහි පළමු මණ්ඩලය හඳුන්වන්නේ කවර නමකින්ද?.....................................................

ii එහි නිල කාලය කොපමණද?..................................................................

17. සෝල්බරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා යටතේ පිහිටවූ ව්‍යවස්ථාදායකය ඉහළ හා පහළ යනුවෙන් මණ්ඩල දෙකකින් සමන්විත වේ. මෙයින්,

i ඉහල මණ්ඩලය ලෙස හැඳින්වූයේ කුමන ආයතනයද?....................................................

ii පහල මණ්ඩලය ලෙස හැඳින්වූයේ කුමන ආයතනයද?....................................................

18. සුළුතර කණ්ඩායම්වල අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා සෝල්බරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් සැපයූ ආවරණ දෙකක් නම් කරන්න.

i.............................................................

ii…………………………………………………………

19. 1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ ස්ථාපිත කල ව්‍යවස්ථාදායකය හැඳින්වූ,

i නිල නාමය කුමක්ද?..........................................................................

ii එහි නිල කාලය කොපමණද?......................................................................

20. රාජ්‍ය සේවය පාලනය කිරීම සඳහා 1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ පිහිට වූ මණ්ඩල දෙක නම් කරන්න.

i…………………………………………………………

ii…………………………………………………………

21. 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් බලතල බෙදා හැරියේ ලැයිස්තු තුනක් යටතේය. ඉන් දෙකක් නම් කරන්න.

i…………………………………………………………

ii…………………………………………………………

22. 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් ස්ථාපිත කරන ලද අධිකරණ පද්ධතියෙහි ඉහලම අධිකරණ ආයතන දෙක දක්වන්න.

i…………………………………………………………

ii…………………………………………………………

23. 18 වන සංශේධනයෙන් ගෙන එන ලද වෙනස්කම් දෙකක් දක්වන්න.

i…………………………………………………………

ii…………………………………………………………

24. 18 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය යටතේ,

i. රජයේ ඉහළ තනතුරුවලට පත් කිරීම සඳහා ජනාධිපතිවරයාට නිර්දේශ සැපයීම පිණිස සංස්ථාපනය කළ සභාවේ නිල නාමය කුමක්ද?....................................................

ii. එම සභාවේ සාමාජික සංඛ්‍යාව කොපමණද?.............................................................

25. 19 වන සංශෝධනය මගින්,

i. ශ්‍රී ලංකාවේ ආණ්ඩු ආයතන පද්ධතියට හඳුන්වා දුන් ආයතනය නම් කරන්න.......................................................................

ii. එහි ධූර කාලය කොපමණද?.......................................................................